Singalesisk

# වඩා හොඳ අනාගතයක් සඳහා SV වෙත ඡන්දය ලබා දෙන්න!



SV

# වඩා හොඳ අනාගතයක් සඳහා SV වෙත ඡන්දය ලබා දෙන්න!

නෝර්වේ රාජ්‍යය සම්බන්ධ සුවිශිෂ්ට දෙයක් වන්නේ පුද්ගලයන් අතර ඇති ආර්ථීක අසමානාත්මතාව අඩු වීමයි. නමුත් මෑත කාලීනව, එය තරමක් වෙනස් වී ඇත. අසමානාත්මතාව වර්ධනය වී ඇත. නෝර්වේ රාජ්‍යය තුළ අද තරම් කෝටිපතියන් සංඛ්‍යාවක් මින් පෙර කවදාකවත් සිට නොමැත. ඒ සමගම, බොහෝ පුද්ගලයන් සඳහා ජීවිත් වීම වඩා වෙහෙසකර බවට පත් වී ඇත.

සෑම දෙයක් ම ඉතා වියදම්කාරී වී ඇත. තවදුරටත් සාමාන්‍ය ආදායමකින් සාමාන්‍ය ජීවිතයක් ගත කිරීම පෙරට වඩා දුෂ්කර කාර්යයක් බවට පත් වී ඇත.

සමාජ අසාමානාත්මතාව අඩු කිරීමට අපට ඇති වඩාත් ම එලදායී මෙවලම වන්නේ සුහසාධන තත්ත්වයයි. නමුත් එය පීඩනයක් යටතේ පවතී. අප එය ආරක්ෂා කර ගත යුතුවා පමණක් නොව සවිමත් කර පුළුල් කිරීම ද සිදු කළ යුතු ය. SV මගින් පාසැල්, ළදරු පාසැල් සහ රෝහල්වල සේවා, කාර්යයන් කිරීමට ප්‍රමාණවත් සේවක සංඛ්‍යාවක් සමගින්, සියලු දෙනා සඳහා ම උසස් තත්ත්වයෙන් ලබා දෙන බව සහතික කරනු ඇත. අපට දරුවන්ගේ ප්‍රතිලාභ වැඩි කිරීමටත්, සෑම දරුවකු ම ළදරු පාසැලට යන බව සහතික කර ගැනීමටත්, සියලු දෙනා සඳහා නොමිලේ දන්ත වෛද්‍ය සේවා ලැබෙන බවට සහතික කිරීමටත් අවශ්‍ය ය.

නෝර්වේ රාජ්‍යයේ ස්වභාවික පරිසරය මහා පරිමාණයෙන් විනාශ වෙමින් පවතී. ඒ හා සමග ම අපි ගෝලීය දේශගුණ අර්බුදයට ද මුහුණ දෙමින් සිටිමු. නෝර්වේ රාජ්‍යය ප්‍රමුඛ වී තමාගේ භූමිකාව ඉටු කළ යුතු ය. අප විසින් නව තෙල් ක්ෂේත්‍ර විවෘත කිරීම නවතමින් රැකියා, ජෛව විවිධත්වය සහ මිනිසුන්ට ස්වභාව ධර්මය වෙත ඇති ප්‍රවේශය ආරක්ෂා කර ගැනීමට පියවර ගත යුතු ය.

SV යුද්ධය සහ අයුක්තිය මගින් බලපෑම්වලට ලක් වූ අය වෙනුවෙන් නැඟී සිටිය යුතු ය. අපි ජාත්‍යන්තර ආධාර වැඩි කර ගැනීමටත්, ගැටුම්වලින් පලා යන පුද්ගලයන්ට ආධාර කිරීමටත් කටයුතු කරන අතර අප විසින් එක්සත් ජනපදය තුළ ඩොනල්ඩ් ට්‍රම්ප් යටතේ සිදු වන ආකාරයේ ප්‍රජාතන්ත්‍රවාදයට එරෙහිව එල්ල කරන සියලු ප්‍රහාර පිටුදකින්නෙමු. නිදහස් පලස්තීනයක් සඳහා වන සටන අපි කිසිවිටකෙත් අත් නොහරින අතර නිදහස සඳහා යුක්රේනියානුවන් සිදු කරන සටනේ දී අපි ඔවුන් සමග එක්ව සිට ගන්නෙමු.

ඔබ එකඟ වනවා ද? සැප්තැම්බර් 8 වැනි දා වන විට SV වෙත ඡන්දය දෙන්න!

**Sosialistisk Venstreparti**
Møllergata 4, 0179 Oslo
21 93 33 00
post@sv.no
sv.no

**Bli medlem i SV her:**